
# රාහුල
# නිර්මාතෘවරුන්



## එෆ්. ගෝර්ඩන් පියර්ස් මහතා

එෆ්. ගෝර්ඩන් පියර්ස් මහතා බ්‍රිතාන්‍ය ජාතිකයෙකි. එහෙත් ඔහු ලංකාවේ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ පරිවර්තන රැසක් සිදු කරන්නට දායක වූයේය. නිදහස ලබන්නට බොහෝ කලකට පෙර බ්‍රිතාන්‍ය කොලනියක් ලෙස පැවැති ලංකාවේ 1913 සිටම විසූ මෙතුමා විදුහල් කිහිපයකම විදුහල්පති පදවිය දරමින් මෙරට අධ්‍යාපන ප්‍රතිපත්තිය දේශීය සංස්කෘතියට ගැලපෙන අයුරින් සම්පාදනය කරන්නට පුරෝගාමීත්වය ලබා දුන්නේය. 1921 දී ගාල්ලේ මහින්ද විද්‍යාලයේ විදුහල් පති වශයෙන් පත්ව 1923 දක්වා සේවය කළ පියර්ස් මහතා  ඉක්බිතිව ඉන්දියාවේ බැංගලෝරයේ විද්‍යාලයකට බැඳුණේය.

නැවත ලංකාවට පැමිණි එතුමා 1945 මාර්තු මාසයේ සිට 1950 මැයි මාසය දක්වා අධ්‍යාපන අමාත්‍යංශයේ සහකාර ලේකම් පදවියක කටයුතු කළේය. බ්‍රිතාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ අත්දැකීම් හා පර්යේෂණ කිහිපයක්ම ලංකාවේ අධ්‍යාපන ක්ෂෙත්‍රයට හඳුන්වා දීමට පියර්ස් මහතා මේ ස්වල්ප කාලයේදී ඉදිරිපත් විය. *"අධ්‍යාපන පර්යේෂණ මණ්ඩලය"* යනුවෙන් නම් කැරැණු ආයතනය මෙහි ප්‍රතිඵලයක් වූ අතර පියර්ස් මහතාගේ උපදෙස් පරිදි නව අත්දැකීම් කිහිපයක්ම සඳහා අත්තිවාරම දමන්නට එකල පැවැති රජයට අවස්ථාව ලැබිණි.

1923 දී මාතර රාහුල විද්‍යාලය ආරම්භ කරන්නට මාතර සිංහල බෞද්ධ ජන නායකයින්ගේ අවධානය යොමු කොට ඔවුන් දිරිගන්වා, සහාය ලබා දෙමින් රාහුල විද්‍යාලයේ සිසුන්ට මුල්ම පාඩම කියා දුන්නේද පියර්ස් මහතාය. එතුමා නිසා නොවේ නම් මුළු මහත් රුහුණේ, දකුණේ පමණක් නොව ලංකාවේම ඉතිහාසයේ පරිච්ඡේද බොහෝ දුරට වෙනස්ව ලියැවෙන්නට ඉඩ තිබිණි. එෆ්. ගෝර්ඩන් පියර්ස් මහතාගේ සේවය මුළු රටම අමතක නොකළ යුතු වන්නේ එහෙයිනි.




## ඩී. ටී. ඩබ්ලිව්. රාජපක්ෂ නොතාරිස් රාළහාමි

ගාල්ල ප්‍රදේශයේ සිංහල බෞද්ධ දරුවන්ට මහින්දය මෙන්ම මාතර ප්‍රදේශයේ සිංහල බෞද්ධ දරුවන්ට ඉංග්‍රීසි විද්‍යාලයක් ආරම්භ කිරීම පිළිබඳව ගෝර්ඩන් පියර්ස් මහතා උනන්දු වූ අවස්ථාවේදී එවකට මාතර සිටි බෞද්ධ ජන නායකයින් පිළිබඳව එතුමා විසින් විමසා බලන ලදී. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජිතයින්ද, දේශීය ව්‍යාපාර වල නිරතවූ ධනවතුන්ද, තවත් නොයෙක් ආකාරයේ ප්‍රභූන්ද මාතර සිටි නමුත් මෙම ඉංග්‍රීසි විද්‍යාලය ආරම්භ කිරීමේ භාරදූර වගකීම ඉසිලිය හැකි කිසිවකු ඔවුන් අතර සිටි බවක් පියර්ස් මහතාට දැන ගන්නට නොලැබිණි. එහෙත් එම පණිවුඩය සිංහල බෞද්ධ ප්‍රභූන් අතර කතාබස් වූ අවස්ථා වල ඒ පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ ජන නායකයකු වශයෙන් ඩී. ටී. ඩබ්ලිව්. රාජපක්ෂ නොතාරිස් රාළහාමි හැඳින්විය හැකිය.

එතුමා පියර්ස් මහතාගේ උපදෙස් පරිදි තමා දන්නා හඳුනන තවත් ප්‍රභූන් කිප දෙනෙකුද කැඳවා සිංහල බෞද්ධ ඉංග්‍රීසි විද්‍යාලයක ඇති වැදගත්කම සාකච්ජා කොට මාතර බෞද්ධ අධ්‍යාපන සංගමය බිහි කිරීමෙහිලා පුරෝගාමී විය. මෙම සංගමයෙහි ප්‍රධානම ඉලක්කය නොවරදවා සපුරා ගැනීම සඳහා පරිත්‍යාගශීලිව හා බාධක බිඳලමින් කටයුතු කිරීම අවශ්‍ය වූ නිසා එතුමාම එහි ලේකම් ධුරයට පත්විය. මාතර මහ විදියේ තාවකාලික වශයෙන් කුලියට ගත් ගොඩනැගිල්ලක පරාක්‍රමබාහු විද්‍යාලය වශයෙන් මෙම ඉංග්‍රීසි අධ්‍යාපනික ආයතනය ආරම්භ වූයේ පූර්ණ වශයෙන්ම එතුමාගේ නායකත්වයෙන් ඉටු කැරුණු කාර්යභාරයන් රැසක් නිසාය.

රාජපක්ෂ නොතාරිස් රාළහාමි සැබෑ සිංහල බෞද්ධ ගුණ යහපත්කම් ජිවිතයට එකතු කරගත් කෙනෙකු වුවා පමණක් නොව ඒවා අනුගමනය කරමින් පරහට දයාවෙන් බොහෝ සමාජ හා ශාසනික සේවාවන්හි නියුක්ත වූ බුද්ධිමතෙකුද වූයේය. එතුමා සිය සේවාවන් හැම විටම ඉටු කළේ දැඩි නිහඬතාවයකිනි. ඇතැම් විට එතුමාගේ පරිත්‍යාගශීලිත්වය පිළිබඳව පවුලේ සාමාජිකයන් පවා දැන නොසිටි බැවි එතුමාගේ අභාවයෙන් පසු හෙළි දරව් වී තිබිණි. එතුමා ප්‍රසිද්ධියට පවා කැමැත්තක් දැක්වූයේ නැත. ඊට දිය හැකි හොඳම නිදර්ශනය නම් පරාක්‍රමබාහු විද්‍යාලය සරම් වලව්වේ නව පරිශ්‍රයට ගෙන යනු ලැබ රාහුල විද්‍යාලය වශයෙන් පරිවර්තනය වී ස්ථාවර තත්ත්වයට පැමිණි පසු සිය අධිෂ්ඨානය මල්පල ගැන්වීමෙන් අප්‍රමාණ වූ තෘප්තියක් ලැබුවා මිස අල්ප මාත්‍රයක හෝ ප්‍රචාරයක් ලබන්නට එතුමා කොහෙත්ම උත්සාහ නොකිරීමයි.

රාහුල වජ්‍ර ජයන්ති සමයේදී සියලු රාහුලයින්ගේම ගෞරවාචාරය එතුමාට හිමි වේ.



## සී. ඒ. ඕදිරිස් ද සිල්වා මහතා

රාහුල විද්‍යාලය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙහිලා අත්‍යාවශ්‍යව තිබූ භූමි භාගය සඳහා ස්වකීය පාරම්පරික උරුමය වශයෙන් මිළට ගත් සරම් සිරිවර්ධන වලව්ව හා තදාසන්න භූමිය පරිත්‍යාග කිරීමෙන් මෙතුමා රුහුණු ප්‍රදේශයට ඉටු කළ සේවය මුළු මහත් රට, දැය හා සමයටම කළ පරිත්‍යාගයක් සේ දැනෙනුයේ රාහුල වජ්‍ර ජයන්ති සමය වන මෙම අවදියේදිය.


1867 අගෝස්තු 02 දින උපත ලත් මෙතුමාගේ පියා වූයේ කන්දඋඩ ආරච්චිගේ ගේබ්‍රියෙල් මහතාය. මව කොර්නේලියා ඇග්නස් ද සිල්වා ජයසිංහ මහත්මියයි. ඔවුහු මාතර නූපේ ද්විභාෂා පාසලෙන් හා වැලිවේරියේ මහා මන්තින්ද පිරිවෙනෙන් සිය පුත් ඕදිරිස් ද සිල්වාට මූලික අධ්‍යාපනය ලබා දුන්හ. තරුණ වියට පත්වූ කල්හි ඔහු සිය ලොකු තාත්තාගේ තෙල් ව්‍යාපාරයේ සෙක්කුවක රැකියාව කෙළේය. ඒ සඳහා ඔහුට දිනකට ශත තුනක් ගෙවනු ලැබීය.

සිය ශ්‍රමයේ අගය තේරුම් ගත් ඕදිරිස් තරුණයා ස්වෝත්සාහයෙන් වෙළඳාමක් ආරම්භ කොට ක්‍රමයෙන් දියුණු වන්නට පටන් ගත්තේය. එමගින් මාතර ප්‍රදේශයේ ඉඩකඩම් රැසක් මිලදී ගත් ඔහු ගාල්ලේ දංගෙදර නෝනහාමි නානායක්කාර සමරසේකර මෙනෙවිය සමග විවාහ විය. ඉන්පසු ඕදිරිස් මහතාගේ ව්‍යාපාර වඩ වඩත් දියුණු වූයෙන් 1885 මාර්තු 01 වැනි දින *"මහමෝල"* ආරම්භ කළේය. තෙල් සිඳීමේ ව්‍යාපාරයට අවශ්‍ය ගවයන් සඳහා තණකොළ වත්තක් වගා කළ ඔහු එහි අතිරික්ත තණකොළ බුදින්නට කිරි හරක් පට්ටියක්ද ආරම්භ කොට එයින්ද ඉතිරි තණකොළ අලෙවි කළේය. එතුමාගේ ව්‍යාපාරික බුද්ධියට මෙය හොඳම නිදසුනකි.

ඕදිරිස් යුවලගේ වැඩිමහල් පුතා එඩ්වින් ද සිල්වා මහතාය. දෙවැන්නා ආරියතිලක මහතාය. තුන්වැන්නා ධර්මපාල මහතාය. සිව්වැන්නා හරිස්චන්ද්‍ර මහතාය. පස්වැන්නා ධනපාල මහතාය. දියණියන් හයදෙනෙක්ද මෙම යුවලට සිටියහ. සිය පුතුන්ට මනා අධ්‍යාපනයක් ලබාදීමට එතුමා ඔවුන් මාතර, ගාල්ලේ හා කොළඹ ඉංග්‍රීසි විද්‍යාලවලට යැවීය.

සිංහල බෞද්ධ ශිෂ්ඨාචාරය හා සංස්කෘතියට අනුරූප වනසේම ඕදිරිස් ද සිල්වා මහතා සහ එම පවුලේ දරුවෝ සිය ව්‍යාපාර පවත්වා ගෙන ගියහ. ඔවුන් මුදල් නිසා හෝ දේපොල නිසා හෝ උද්දාම වූයේ නැත. ගති පැවතුම් හා සිරිත් විරිත් අමතක කළේ නැත. දිළින්දා තලා පෙලා සේවයේ යෙදුවේ නැත. ඒ වෙනුවට සිය ව්‍යාපාරයට සම්බන්ධ හැමදෙනාම කෙරෙහි පමණක් නොව, උදව් උපකාර පතා පැමිණි ඕනෑම කෙනෙකුට වුවද බත බුලතින්ද, කාරුණික වචනයෙන් හා චර්යාවෙන්ද සංග්‍රහ කරන්නට අමතක කෙළේ නැත.

ඕදිරිස් ද සිල්වා මහතා 1928 මැයි 23 දින අභාවප්‍රාප්ත විය. රුහුණු ප්‍රදේශයේ සිංහල බෞද්ධ ආභාෂය රැක ගැනීමෙහිලා අති මහත්සේ පුරෝගාමී වූ උදාර සිංහල බෞද්ධ ජන නායකයකු ලෙස ඕදිරිස් ද සිල්වා මහතා අනුස්මරණය කළ යුතුවෙයි.



## සී. ඒ. ආරියතිලක මහතා

රාහුල විද්‍යාලය වැලිවේරිය සරම් සිරිවර්ධන වලව්ව පැවැති භූමියේ ආරම්භ කිරීමට සී. ඒ. ඕදිරිස් ද සිල්වා මහතා විසින් කරන ලද පරිත්‍යාගයෙන් පසු විද්‍යාලයේ කළමනාකාර ධූරයේ කටයුතු භාරවූයේ ඕදිරිස් ද සිල්වා මහතාගේ දෙවැනි පුත් ආරියතිලක මහතාටය. ජ්‍යෙෂ්ඨ පුත් එඩ්වින් ද සිල්වා මහතාට ව්‍යාපාරික කටයුතු භාරවී තිබිනි.

ආරියතිලක මහතා උපන්නේ 1894 අගෝස්තු 12 වැනිදාය. මාතර සාන්ත තෝමස් විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලැබූ ආරියතිලක ශිෂ්‍යයා වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ ආනන්ද විද්‍යාලයට යවනු ලැබීය. කොළඹ දෙමටගොඩ පාරේ නිවසක සිය බාල සොයොයුරු ධර්මපාලයින්ද සමග නතරවී, ආනන්දයේ අධ්‍යාපනය ලැබූ සමයේ ආරියතිලක තරුණයාගේ ජීවිතයට සුවිශේෂ අත්දැකීම් කිහිපයක් එකතු විය. ඔහු ව්‍යාපාරික කටයුතුවලට වඩා සමාජ සේවයටත්, සිංහල බෞද්ධ සදාචාරයටත් නැඹුරුව සිටි එම අවදියේදී අනගාරික ධර්මපාල, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, දොස්තර සී. ඒ. හේවාවිතාරණ, ඩී. එස්. සේනානායක, පී. ද එස්. කුලරත්න ආදී දේශප්‍රේමීන් සියැසින්ම දැක බලා ගන්නටත්, එතුමන්ගේ දේශන එම හඬින්ම ශ්‍රවනය කරන්නටත් තරුණ ආරියතිලකයන්ට අවස්ථාව උදාවිය. මෙයින් සිය ජාතිවාත්සල්‍යය වඩාත් පණ පොවා ගත් ඔහු ද්විතියික අධ්‍යාපනය හමාර කොට ආපසු ගමට ආවේ පූර්ණ පෞරුෂත්වයකින් යුතුවය.

මාතර තෙල් කඩේ අප්පුහාමි ලෙස ප්‍රකටව සිටි වෙළඳ ව්‍යාපාරික එන්. ඩබ්ලිව්. සමරසේකර මහතාගේ දියණිය වූ රොස්ලින්ඩ් සමරසේකර මෙනෙවිය සමග විවාහ වූ තරුණ ආරියතිලක මහතා මහමෝල ඉදිරිපස පිහිටි කෝරලේ වලව්ව නමැති ඉඩමේ නිවසක් ඉදිකොට එහි පදිංචි වූයේය. සිය බිරිඳගේද අනුබලය ලැබීම නිසා ආරියතිලක මහතාගේ සමාජසේවා කටයුතු වඩාත් පුළුල් වන්නට වූයෙන් මාතර ප්‍රදේශයේ එතුමා නොමැති සමාජසේවා කාර්යයක් සිදුනොවූ තරම් විය. රාහුල විද්‍යාලයට අමතරව පාලටුව ගුණරතන විද්‍යාලය, නාවිමන මහාරාජ විද්‍යාලය, හිත්තැටිය රජමහා විහාරය සහ මහා මන්තින්ද පිරිවෙන ආරියතිලක මහතාගේ අනුග්‍රහය හා පරිත්‍යාග ලත් ආයතන කිහිපයක් පමණි.

සිය පියාණන්ගේ සී. ඒ. ඕදිරිස් ද සිල්වා සහ පුත්‍ර සමාගම නමැති වෙළඳ ව්‍යාපාර සමූහය මගින් ලත් ආදායමින් කොටසක් මෙසේ ජාතිකාගමික සේවාවන් සඳහා යොදන්නට සිදුවීමෙන් එම පවුලේ කිසිවකු කම්පාවට පත්වූයේ නැත. එහි හැම දෙනෙකුටම මෙම උදාර සේවාවන්හි යෙදීම දෙමව්පියන් විසින් මනාව හුරු පුරුදු කොට තිබිණි.

මේ සා මහත් සේවාවන් රැසක් රුහුණු දේශය වෙනුවෙන් ඉටු කිරීමෙන් පසු සත් පුරුෂ පරහිතකාමී සී. ඒ. ආරියතිලක මහතා 1969 ජූනි 22 දින අභාවප්‍රාප්ත විය.